**රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමය - 2017**

--------------------------------------------------------------------------

රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමය ආඥා පනතේ (283 අධිකාරය) සහ 1983 අංක 18 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගම් පනතේ 18 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංගමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

## 2.1 මතය

-------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සාමාජිකත්වය අහෝසි වී ඇති සාමාජිකයන්ගේ දායක මුදල් ගිණුමේ නිරවුල් කර නොතිබුණු රු.12,062,928 ක බැර ශේෂය විධිමත් පරිදි හඳුනා ගෙන නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සාමාජිකයා මිය යාම හෝ වෙනත් හේතු මත අය වීම හිඟ හිට ඇති ණයගැතියන් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු එකතුව රු.11,272,222 ක ශේෂ 2017 දෙසැම්බර් 31 දින දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඇ) සාමාජිකයා ස්ථාන මාරු වීම, විදේශ දූත මණ්ඩල සේවයේ යෙදීම, විදේශගත වීම හා වෙනත් හේතූන් මත අය වීම හිඟ හිට ඇති රු.2,185,885 ක දායක මුදල් හා රු.7,098,717 ක ණය වාරික ඇතුළත් එකතුව රු.9,284,602 ක හිඟ ශේෂයක් 2017 දෙසැම්බර් 31 දිනටත් නිරවුල්කර නොමැති බව නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

### 2.2.2 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

---

පහත දැක්වෙන නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1891 අංක 05 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමයේ ව්‍යවස්ථාවෙහි 16 (I), (2) සහ (3) වගන්ති | ණය වර්ග හයකට අදාළව ණය මුදලේ සීමාවන් වැඩි කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දී ඒ සඳහා අදාළ රීති ගැසට් පත්‍රයේ පළ කර නොතිබුණි. තවද, එසේ රීති සංශෝධනයකින් තොරව පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා රු.500,000 ක ණය මුදලක් ලබා දීමටත්, විශ්‍රාම අරමුදලක් සඳහා සාමාජිකයින්ගෙන් රු.2,099,785 ක් අය කර ගැනීමටත්, අය කළ මුදලින් රු.2,467,414 ක මුදලක් සාමාජිකයන් වෙත ගෙවීමටත් සමාලෝචිත වර්ෂයේ දී සංගමය විසින් කටයුතු කර තිබුණි. |

| | |
|---|---|
| (ආ) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමයේ සංශෝධිත ව්‍යවස්ථාව | |
| (i) I පරිච්ඡේදයේ 10 (1) වගන්තිය | සාමාජිකයෙකුගේ මරණය දැනුම්දී මාස දෙකක් ඇතුලත ඔහුට හිමි ප්‍රදානය ගෙවිය යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දිනට සාමාජිකයන් 46 දෙනෙක් සඳහා එසේ ගෙවිය යුතු රු.2,035,000 ක මරණ ප්‍රදාන මුදල් ගෙවා නොතිබුණි. |
| (ii) I වන පරිච්ඡේදයේ 7 (ආ) (i) වගන්තිය | ණය වාරික 6 කට වඩා හිඟ හිටි සාමාජිකයන් 15 දෙනෙකු වෙනුවෙන් ව්‍යවස්ථානුකූලව ගත යුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**
--------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංගමයේ මූල්‍ය ප්‍රතිඵලය රු.51,606,969 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.44,653,408 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,953,561 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ණය පොළී ආදායම රු.8,292,494 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී, 2013 වර්ෂයේ දී රු.34,982,548 ක් වූ බදු පසු ශුද්ධ ලාභය අඛණ්ඩව වර්ධනය වී තිබුණි. එමෙන්ම රජයට ගෙවූ බදු, සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමෙන් පසු 2013 වර්ෂයේ දී රු.58,369,240 ක් වූ ආයතනයේ දායකත්වය සමාලෝචිත වර්ෂයේ දී රු.81,116,152 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**
-----------------------------

**4.1 කාර්යසාධනය**
------------------

**4.1.1 සැලසුම් කිරීම**
------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව සංගමය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංගමය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ බිම් මහලේ පරිශ්‍රයෙන් කොටසක් 2013 වර්ෂයට අදාලව බාහිර ආයතනයකට කුලියට ලබා දී තිබුණු අතර ඊට අදාලව අයවිය යුතු හිඟ කුලිය රු.127,000 ක් විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට සංගමය වෙත ලැබී තිබුණු විවිධ ආදායම් හා වෙනත් ලැබීම්වල එකතුව රු.1,660,266 ක් විධිමත් පරිදි හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සාමාජිකයාගේ මූලික වැටුපෙන් සාමාජිකයා එකඟ වූ ප්‍රතිශතයක් සාමාජික දායක මුදල් ලෙස සංගමය විසින් මාසිකව අය කරනු ලබයි. එහෙත් සාමාජිකයාගේ මූලික වැටුප වාර්ෂිකව වැඩි වී තිබුණ ද වැඩි වූ මූලික වැටුපට අනුරූපව සාමාජිකයින් ගෙන් සාමාජික දායක මුදල් අය කර නොතිබුණ බව නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ඈ) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3.5 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ණය මුදල් ලබාදීමේ දී වැටුපෙන් මාසිකව අය කර ගත හැකි සියයට 40 සීමාව පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව ණය මුදල් ලබා දී තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එකතුව රු.5,125,418 ක දේපළ ණය ශේෂයක් පවතින සාමාජිකයන් 5 දෙනෙකුගේ ණය වාරික 3ත් වාරික 12ත් අතර ප්‍රමාණයක් ආයතන විසින් අයකර සංගමය වෙත ලබාදීමට කටයුතු කර නොතිබුණු අවස්ථා විගණනයේදී සිදුකල නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

## 5. තිරසාර සංවර්ධනය

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළ ව රාජ්‍ය සේවා අන්‍යෝන්‍යාධාර අර්ථසාධක සංගමය විසින් තම විෂය පථයට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 6.1 ප්‍රසම්පාදනය

සංගමය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුල සිදු වී ඇති වෙනස්කම් සැලකිල්ලට ගෙන ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව, සැලසුමේ ඇතුළත් එකතුව රු.6,566,500 ක් වටිනා කාර්යයන් 9ක් සමාලෝචිත වර්ෂය තුල දී ඉටු කර නොතිබුණ අතර සැලසුමේ ඇතුළත් නොවූ එකතුව රු.342,755 ක් වටිනා කාර්යයන් 4 ක් වෙනුවෙන් ප්‍රසම්පාදන කටයුතු සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය.

### 6.2 අයවැය ලේඛනමය පාලනය

විෂයයන් 58 කට අදාළව අයවැයගත සහ තත්‍ය අගයන් අතර සියයට 10 සිට සියයට 164 දක්වා වූ පරාසයක විචලනයක් පැවති බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සංගමයේ ඒකාබද්ධ ලේකම් සහ භාණ්ඩාගාරිකගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | මරණ ප්‍රදාන ක්‍රමය | මරණ ප්‍රදාන ගෙවීමේ ප්‍රමාදය වැළැක්විය හැකි විධිමත් ක්‍රමවේදයක් නොවීම. |
| (ආ) | සංගමයේ කාර්යය මණ්ඩල ණය පරිපාලනය | කාර්යය මණ්ඩල ණය පරිගණක පද්ධතිය මඟින් පරිපාලනය නොවීම. |